ALL CEYLON TRADITIONAL COCONUT OIL MANUFACTURES ASSOCIATION LTD
1st Floor, No.223, Hill Street, Dehiwala, Sri Lanka Postcode : 10350
Tel : 0113-171660 Fax : 0112/734953
Email : actcomcey@gmail.com
ACTCOMa

2022.01.26

සභාපති,
අවධානය - කිර්ති ශ්‍රී විජේසිංහ මහතා
පොල් සංවර්ධන අධිකාරිය,

ප්‍රිය මහත්මයාණෙනි,

**මහජනයාට සැබෑ තොරතුරු වසන් කරමින් ආනයනික පොල්තෙල් පිළිබඳ වගකීම් විරහිත ලෙස සහතික ලබාදීම පිළිබඳව.**

ඔබ ආයතනය විසින් පොල්තෙල් සඳහා තරු සහතික ලබාදීම පිළිබඳව පුවත්පත්වල පළකරන ලද දැන්වීම් සහ ඔබ විසින් ජනමාධ්‍ය වෙත කරනු ලබන ප්‍රකාශ මගින් පහත සඳහන් වැරදි සිදුවන බැවින් වහාම ඒම වැරදි නිවැරදි කරන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිමු.

1. රට තුළට ආනයනය කරන භාවිතා කරන ලද හෙවත් දැවි තෙල් මිශ්‍රිත බොර තෙල් සහ කරුටු තෙල් ආදී පිරි පහදු නොකළ පොල්තෙල් රට තුළදී ආර්.ඞී.බී. නමින් හැඳින්වෙන භෞතික පිරිපහදු ක්‍රියාවලියට භාජනය කිරීම මගින් ඒවායේ අඩංගු විය හැකි ඇෆ්ලටොක්සීන් නැමති උග්‍ර විෂ වර්ගය ඉවත් වන බවට විද්‍යාත්මකව වැරදි සහ මහජනයා නොමග යවන මෙන්ම ඒසේ නොමග යැවීම මගින් මහජන සෞඛ්‍යය අනතුරට ලක්කෙරෙන සහතිකයක් ලබාදීම.
   තෙල්වල අන්තර්ගත ඇෆ්ලටොක්සීන් 100% ක් ඉවත් කිරීමේ පිළිගත් ක්‍රමවේදයක් මෙතෙක් දේශීයව හෝ ජාත්‍යන්තරව හෝ හඳුන්වා දී නොමැත.
   කෙසේ වෙතත් ඔබ විසින් සඳහන් කරන ඇෆ්ලටොක්සීන් ඉවත් කිරීමට අනුගමනය කරන ක්‍රමවේදය කුමක්ද?
   එකී ක්‍රමවේදයන් තුළින් මනුෂ්‍ය ශරීරයට සිදු වන හානි කර බලපෑම් මොනවාද?
   මනුෂ්‍ය ශරීරයට වන අහිතකර බලපෑම් පිළිගත් ආයතන වලින් සොයා බලා පරික්ෂා කර ඇත්ද?
   එම පරීක්ෂණ කොපමණ කාලයක් තිස්සේ කර ඇත්ද?
   ඔබ වැනි අයෙකු ඒවැනි වැරදි සහ ව්‍යාජ සහතිකයක් ලබාදුන් විට ඒය පිළැගිනීමට ඇති සම්භාවිතාවය වැඩිවන බැවින් වරද වඩාත් බරපතළ වේ.

2. ඔබ ආයතනය විසින් හඳුන්වාදී ඇති සහතික කිරීමේ ක්‍රමවේදය තුළ පහත සඳහන් ප්‍රධාන වැරදි 05 සිදුවේ.

පොල්තෙල්වල ගුණාත්මක භාවය සහතික කිරීම සඳහා යොදන්නා ප්‍රමිතීන් පිළිබදව එළිදරව් නොකිරීමය. උදාහරණයක් ලෙස ඇෆ්ල්ටොක්ෂින් අඩංගු විය හැකි අවම ප්‍රමාණය සඳහන් නොකිරීම. (ඒම ප්‍රමාණයන් සඳහා යුරෝපයේ සහ ඇමෙරිකාවේ වෙනස් අගයන් යොදාගන්නා අතර ශ්‍රී ලංකාවේ සෞඛ්‍යය දෙපාර්තමේන්තුව සහ ප්‍රමිත ආයතනය විසින් පනවා ඇති සම්මතයන් අතර ද බරපතළ වෙනසක් ඇත.)

I. එසේ ප්‍රමිතීන් සහතික කිරීම සඳහා යොදාගන්නා පරීක්ෂණ මොනවාදැයි සඳහන් නොකිරීම.

II. එම පරීක්ෂණ සිදුකරන ප්‍රතීතරණ සහතිකය සහිත පරීක්ෂණාගාර මොනවාදැයි එළිදරව් නොකිරීම.

III. නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතික කිරීම සඳහා යොදාගන්නා යහපත් කර්මාන්ත පුරුදු හෙවත් G.M.P ප්‍රමිතීන් මොනවාද යන්න සඳහන් නොකිරීම.

IV. දේශිය පොල්තෙල් සඳහා සහතික ලබාදීමේදී ආනයනික තෙල් ආනයනකරුවන්ට ද සහතික ලබාදීම මගින් ආනයනික බාල තෙල් දේශිය තෙල්වලට මිශ්‍රකර ව්‍යාජ ලෙස සහතික ලබාගැනීමට ඉඩ සැළසීම.

(එම තත්වය තුළ ඒක් පැත්තකින් මහජනයාට තොරතුරු සැගවීමක් සිදුවන අතර මහජන විශ්වාසය පළුදු වේ. අනෙක් පැත්තෙන් ජාවාරම්කාර ආනයනකරුවන්ට රට තුළට බාල පොල්තෙල් ආනයනය කිරීමට සහ දේශිය පොල් තෙල් වෙළඳපල තුළ මිල විකෘතියක් ඇතිකිරීම මගින් දේශිය පොල්තෙල් කර්මාන්ත පද්ධතිය බිඳ වැට්ටවීමට අවස්ථාව ලැබේ. ඊට අමතරව පොල්තෙල් ආනයනය සඳහා පණවා තිබූ කි්‍ර.ගෑ. 1කට රුපියල් 295ක් වූ විශේෂ බද්ද රුපියල් 125 දක්වා අඩු කිරීම මගින් රුපියල් 170ක වාසියක් ආනයනකරුවන්ට ලබාදී ඇතත් පාරිභෝගිකයාට මිල අඩුවීමක් සිදුවූයේ නැත. මේ වන විට තෙල්ආනයනකරුවන් විසින් කෘතිමව මිල වැඩිකිරීම මගින් ඉතිරි කි්‍ර.ගෑ. 1කකට රුපියල් 125ක බදු මුදල අඩු ඉවත්කර ගැනීම සඳහා කූඨ උත්සාහයක් ගන්නා බවද වාර්තා වේ. ඒවැනි බදු වංචා නිසා රජයට හෙවත් මහජනයාට සිදුවන පාඩුව වාර්ෂිකව රුපියල් මිලියන 30000කට අධික වේ. ආනයනකරුවන්ගේ සාක්කුවට වැටෙන අතිරික්ත ලාභය යොදා ගනිමින් ඔවුන් විසින් රාජ්‍ය ආයතන ප්‍රධානීන් මිලදී ගන්නා බවටද චෝදනා එල්ල වේ. )

3. ජනධිපතිතුමා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීන්දුවකට පටහැනිව ක්‍රියා කිරීම. ඒනම් පිරිපහදු නොකළ පොල්තෙල් සහ සමස්ථයක් ලෙස පොල්තෙල් ආනයනය අධෛර්යමත් කිරීම මගින් ඒ වෙනුවට අමුද්‍රව්‍යය (කැබලිකළ වියලි පොල්) ආනයනය කිරීම මගින් දේශියව පොල්තෙල් නිෂ්පාදනය කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදීය යුතුය යන තීන්දුවට පටහැනිව ආනයනික තෙල් වර්ග ප්‍රචලිත කිරීමට ඉදිරිපත් වීම, ඒ තුළ නියාමන ආයතනයක ප්‍රධානියා කුමන හෝ හේතුවක් මත දේශිය පොල් කරුමාන්තකරුවන්ට එරෙහිව ආනයනකරුවන්ට පක්ෂ පාතීව කටයුතු කරන බවට ජනමතයක් ඇතිවීම මගින් ආයතනය පිළිබඳ විශ්වාසය බිඳවැටීමක්ද සිදුවේ.

මේ වගට



බුද්ධික ද සිල්වා
ප්‍රධාන කැඳවුම්කරු

පිටපත්
1. අතිගරු ජනාධිපතිතුමා
2. කර්මාන්ත අමාත්‍ය මාත්‍ය ගරු විමල් වීරවංශ මැතිතුමා
3. වැවිලි කර්මාන්ත ආමාත්‍ය ගරු රමේෂ් පතිරණ මැතිතුමා
4. රාජ්‍ය අමාත්‍ය ගරු අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා